# ඒකපුත්තක සූත්‍රය සහ ඒකධීතු සූත්‍රය

(සං.නි. 2, බු.ජ.ත්‍රි. 358-360 පිටු ලාභසක්කාර සංයුත්ත, දරුණවග්ග)

තම දරුවන් පිළිබඳ මව්පියන් විසින් කෙබඳු ආකල්පයක් ඇති කර ගත යුතු ද යන්න පැහැදිලි කරමින් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත 'ඒකපුත්ත සූත්‍රය' සහ 'ඒකධීතු සූත්‍රය' සියලු මව්පියන් විසින් දැන ගත යුතු අතිශය වැදගත් අනුශාසනයකි. මෙම සූත්‍ර ඇතුළත් වන්නේ ත්‍රිපිටකයෙහි සූත්‍ර පිටකයෙහි සංයුත්ත නිකායෙහි ලාභසක්කාර සංයුත්තයෙහි දරුණවග්ගයටයි. මෙම වග්ගයෙහි විශේෂයෙන් කරුණු සඳහන් වන්නේ ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවලට හසුවීමෙන් සිදුවන අනර්ථයත් එයට හසු නොවීමෙහි වැදගත්කමත් පිළිබඳවයි. භාග්‍යවතුන් වහන්සේ අනුශාසනා කිරීමේ දී ගිහි පැවිදි සැමට එක සේ අවධාරණය කොට ඇත්තේ ලාභ සත්කාර කීර්ති ප්‍රසංශා හමුවෙහි මුළා නොවී සිහිනුවණින් කටයුතු කරන ලෙසයි. ලාභ සත්කාරවලට ගිජු වී අනතුරට පත් නොවන ලෙසයි. ලාභ සත්කාර හමුවෙහි නොමුළාව ක්‍රියා කළහොත් ලෞකික ජීවිතයත් ලෝකෝත්තර ජීවිතයත් යන දෙක ම ජය ගැනීමට අවස්ථාව සැලසේ. ලෝකයට උපරිම සේවයක් කිරීමට ද මෙමගින් අවකාශ උදවේ. තවද මෙලොව උපන් තැනැත්තකු ගිහියකු වශයෙන් හෝ පැවිද්දකු වශයෙන් හෝ ලද හැකි උපරිම ආධ්‍යාත්මික දියුණුව ද මෙම සූත්‍ර දෙකින් පැහැදිලි කර තිබේ. ඒ සඳහා පාදක වන උසස් ම පරමාදර්ශ ද ඉදිරිපත් කර ඇත.

ඒකපුත්ත සූත්‍රයට අනුව කිසියම් සැදැහැවත් උපාසිකාවකට ප්‍රියමනාව එක ම පුතෙක් සිටී නම් එම පුතාගෙන් කළ යුතු ඉල්ලීමක් (ආයාචනාවක්) සඳහන් වේ. එනම් 'පුතණුවනි, ඔබ චිත්තගෘහපති හෝ හත්‍ථාලවක හෝ බඳු වන්න' යනුවෙනි. ඒ අතර යම් දිනෙක එම පුතා පැවිදි වීමට කැමැති නම් 'පුතණුවනි, ඔබ සැරියුත් මාහිමියන් හෝ මුගලන් මාහිමියන් හෝ බඳු වන්න' යනුවෙනි. තවද 'ඔබ වෙත ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා නොපැමිණේවා, ඉදින් පැමිණේ නම් එම ලාභසත්කාර කීර්ති ප්‍රශංසා ඔබට අන්තරා පිණිස නොපවතීවා' යනුවෙනි. පුතකු පිළිබඳ මෙබඳු ඉල්ලීමක් කිරීමට උපදෙස් ලබා දෙන බුදුරජාණන් වහන්සේ තම එක ම දියණියක පිළිබඳව ද මෙබඳු ඉල්ලීමක් කරන ලෙස දේශනා කරති. ඒ බව 'ඒකධීතු සූත්‍රයෙහි' විස්තර වේ.

ඒකධීතු සූත්‍රයෙහි දැක්වෙන පරිදි කිසියම් සැදැහැවත් උපාසිකාවකට ප්‍රියමනාව එක ම දියණියක් සිටී නම් එම දියණියගෙන් කළ යුතු ඉල්ලීමක් (ආයාචනාවක්) සඳහන් වේ. එනම් 'දියණියනි, ඔබ ඛුජ්ජුත්තරාව හෝ නන්‍දමාතාව හෝ බඳු වන්න' යනුවෙනි. ඒ අතර යම් දිනෙක එම දියණිය පැවිදි වීමට කැමැති නම් 'දියණියනි, ඔබ ඛේමා මෙහෙණිය හෝ උප්පලවණ්ණා මෙහෙණිය හෝ බඳු වන්න' යනුවෙනි. තව ද 'ඔබ වෙත ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා නොපැමිණේවා, ඉදින් ලාභසත්කාර පැමිණේ නම් එම ලාභසත්කාර කීර්ති ප්‍රශංසා ඔබට අන්තරා පිණිස නොපවතීවා' යනුවෙන් ඉල්ලා සිටින ලෙස ද දැක්වේ.

සමාජය දෙස බැලූ විට පෙනී යන කරුණක් නම් හැම දෙනාට ම දරුවන් නොමැති වුව ද මව්පියන් නොවුව ද හැම කෙනෙක් ම දෙමාපියන් ලැබූ දරුවන් වන බවයි. එනිසා දරුවන් වශයෙන් හැම දෙනා ම තම මව්පියන්ට කළ යුතු යුතුකම් හැම දෙනා වෙත ම පැවරේ. ජීවත් ව සිටියදී වියපත් දෙමාපියන් මැනැවින් රැකබලා ගනීම ප්‍රධාන යුතුකමකි. ඒ අතර ඒ අයගේ ශ්‍රද්ධාව, ශීලය, ත්‍යාගය, ප්‍රඥාව වැඩි කරලන සේ ක්‍රියා කිරීම ද වැදගත් වේ. දෙමාපියන් ජීවත් ව සිටිය දී මෙලෙස උපස්ථාන කරන අතර ඒ අය මිය ගිය පසුව දක්ෂිණාවන් පවත්වා පුණ්‍යානුමෝදනා කිරීම ද අප සතු යුතුකමකි. තවද ඒ අයගේ ගෞරවය සුරැකෙන පරිදි අපගේ සියලු චර්යා සකසා ගත යුතුව පවතී. තම මව්පියන්ට කරන ලොකු ම ගෞරවය නම් ඒ අයට වඩාත් පින් වැඩෙන ක්‍රියාව නම් තමන් හැකිතාක් ධර්මානුකූල ජීවිතයක් ගත කරමින් බුදුදහමින් දේශිත අනුශාසනාවන්හි ප්‍රතිඵල මේ ජීවිතය තුළ දී ම ලබා ගැනීමට උත්සාහවත් වීමයි.

ඉහත සූත්‍රයන්ට අනුව දෙමාපියන් විසින් විශේෂයෙන් ම දරුවන්ගෙන් අපේක්ෂා කළ යුත්තේ ඔවුන් ආධ්‍යාත්මික වශයෙන් උසස් තත්ත්වයකට පත්කර ලීමයි. තම දරුවන් ගිහිජීවිත ගත කරනවා නම් නන්‍දමාතා, ඛුජ්ජුත්තරා, චිත්තගෘහපති, හත්‍ථාලවක යන ශ්‍රාවකයන් ආදර්ශයට ගත යුතු බව මෙහි ලා සඳහන් වේ. මෙම සිව්දෙනා ම අනාගාමී ඵලයට පත් ව සිටි ගිහි ශ්‍රාවකයන් ය. එබැවින් ගිහිගෙයි වෙසෙන්නකු විසින් මොවුන් ආදර්ශයට ගත යුතු බව බුදුදහමින් අනුශාසනා කරන්නේ ඔවුන් ඉහළ ම ආදර්ශ වන බැවිනි. ඔවුන් පැවිදි

වීමට කැමැති නම් එහි දී ඔවුන්ට සැරියුත් හිමි, මුගලන් හිමි, ඛේමා මෙහෙණිය, උප්පලවණ්ණා මෙහෙණිය බඳු වන්නට ආයාචනා කළ යුතු ය. පැවිදි ස්වාමීන් වහන්සේලාට ඇති පරමාදර්ශ මෙම ස්වාමීන් වහන්සේලාගේ ජීවිත ආදර්ශයි.

දෙමාපියන්ට සිටින වටිනා ම වස්තුව තම දරුවන් ය (*පුත්තා වත්ථු මනුස්සානං*). එම වස්තුව සැබෑ සම්පතක් කර ගැනීමට නම් ඔවුන් ආධ්‍යාපනයෙන් පමණක් නොව ආධ්‍යාත්මික වශයෙන් ද උසස් තලයකට පත් විය යුතු ය. මෙබඳු සමයෙක මිනිස් ලොව දරුවන් උපදින්නේ මහත් වූ පිනක ආනිසංස වශයෙන් එබැවින් එම දරුවන්ට ලබා දෙන වටිනා ම වස්තුව වන්නේ තෙරුවනේ ආශීර්වාදය හා ආදර්ශයයි. මේ නිසා දරුවකු කුස පිළිසිඳ ගත් ද පටන් එම දරුවා වෙනුවෙන් පුදපූජා පවත්වමින්, සිල්සමාදන් වෙමින් ආශීර්වාද කරන්නේ දරුවාගේ දියුණුව අපේක්ෂාවෙනි. මෙලෙස ලොවට බිහිවන දරුවන් ආධ්‍යාත්මික වශයෙන් උසස් තලයකට පත්වුවහොත් එය අධ්‍යාපනික වශයෙන් හෝ දේශපාලනික වශයෙන් හෝ දරුවන් ඉහළ තලයකට පත්වීමට වඩා බෙහෙවින් වටිනා වූවකි. මව්පියන් තම ජීවිතයෙහි අවසාන සමයෙහි දරුවන් ගැන වඩාත් සතුටට පත් වන්නේ ඔවුන් ගුණදහමින් ප්‍රඥාවෙන් ආධ්‍යාත්මික වශයෙන් දියුණු වූ පමණටයි.

### මව්පිය - දූදරු යුතුකම්

සිගාලෝවාද සූත්‍රයෙහි සදිසාවන් දක්වීමේ දී මව්පියන් පෙරදිග ලෙසත් අඹුදරුවන් අවර (බටහිර) දිග ලෙසත් දක්වා ඔවුන්ගේ යුතුකම් පැහැදිලි කර තිබේ.

*'මාතාපිතා දිසා පුබ්බා ආචරියා දක්ඛිණා දිසා,*
*පුත්තදරා දිසා පච්ඡා මිත්තාමච්චා ච උත්තරා.*

නැගෙනහිර හෙවත් පෙරදිග නම් වූ දෙමාපියන් කෙරෙහි දරුවන් විසින් පිළිපැදිය යුතු කරුණු 5කි.

එනම්,

1. ආහාරපානයෙන් පෝෂණය කරන්නෙමි (*භතො නෙසං භරිස්සාමි*).
2. ඔවුන්ගේ කටයුතු කර දෙන්නෙමි (*කිච්චං නෙසං කරිස්සාමි*).
3. කුලවංශය රකින්නෙමි (*කුලවංසං ඨපෙස්සාමි*).
4. දයාද ආරක්ෂා කරමි(*දයජ්ජං පටිපජ්ජාමි*).
5. මාපියන් මියගිය කල්හි දක්ෂිණා සිදුකොට පින් අනුමෝදන් කරවන්නෙමි
(*අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි*).

මෙලෙස දෙමාපියන් වශයෙන් සංග්‍රහ ලැබීමට නම් දෙමාපියන් විසින් ද කරුණු පහකින් තම දරුවන්ට සංග්‍රහ කොට තිබිය යුතු ය. එනම්,

1. දරුවන් පවින් වළක්වති (*පාපා නිවාරෙන්ති*).
2. යහපතෙහි යොදවති (*කල්‍යාණෙ නිවෙසෙන්ති*).
3. අධ්‍යාපනය / ශිල්ප ලබා දෙති (*සිප්පං සික්ඛාපෙන්ති*).
4. සුදුසු දූරියන් හා ආවාහ කෙරෙති (*පතිරූපෙන දරෙන සංයොජෙන්ති*).
5. සුදුසු කල්හි දයාද පවරා දෙති (*සමයෙ දයජ්ජං නීයාදෙන්ති*).

මෙලෙස දෙමාපිය - දූදරුවන් වශයෙන් ඔවුනොවුන් අන්‍යොන්‍ය වශයෙන් සිය යුතුකම් ඉටු කරන කල පෙරදිග පුදන ලද්දේ වෙයි. උපද්‍රව රහිත වූයේ ක්ෂේම වූයේ ද වේ.

### මව්පිය උපස්ථානය උතුම් මංගල කරුණකි

*මාතාපිතු උපට්ඨානං පුත්තදරංස්ස සංගහො.. එතං මංගල මුත්තමං* යනුවෙන් දක්වෙන පරිදි තම මව්පියන්ට උපස්ථාන කිරීමත් අඹුදරුවන්ට සංග්‍රහ කිරීමත් උතුම් මංගල කරුණු වශයෙන් සඳහන් කර ඇත.

තම නිවසේ සිට ම නිතර පින් කර ගත හැකි පින්කුඹුරක් ලෙස මව්පිය උපස්ථානය දහමෙහි දක්වා තිබේ. ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය යනු ගුණයන්ගෙන් හෙබි තම මව්පියන්ට කරුණාවෙන් උපස්ථාන කිරීම සුගතිගාමී වීමට තරම් හේතුවන කුසලයක් වශයෙන් බුදුදහමෙහි දක්වා තිබේ. ***සුඛා මත්තෙය්‍යතා ලොකෙ අථො පෙත්තෙය්‍යතා සුඛා*** යනුවෙන් දැක්වෙන පරිදි මව්පියන්ට සැලකීම සැප ගෙන දෙන කරුණක් වශයෙන් සඳහන් වේ.

## මව්පියන් වෙතින් දරුවන්ට නිවැරදි ආදර්ශය

දූදරුවන් නිරතුරුව ආදර්ශයට ගන්නේ තම දෙමාපියන් ය. එමනිසා දෙමාපියන් වශයෙන් වැඩිහිටියන් නිරතුරුව තම දරුවන්ට ආදර්ශයක් (කැඩපතක්) වන අයුරින් තම චර්යා පවත්වා ගත යුතු ව පවතී. ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යනාදි ගුණාංගවලින් දිනපතා දියුණුවට පත් වෙමින් දරුවන්ට යහපත් ආදර්ශයක් ලබා දීමට දෙමාපියන් නිතර ක්‍රියා කිරීම අවශ්‍ය වේ. හුදෙක් අවවාද දීම පමණක් නොව ආදර්ශයෙන් ම මෙය ප්‍රදර්ශනය කළ යුතුව ඇත.

දිනක් අජාසත් රජතුමා බුදුරදුන් මුණ ගැසීමට ආරණ්‍යකට ගිය අවස්ථාවෙහි ස්වාමීන් වහන්සේලා පන්සිය නමක් බුදුරදුන් සමග එම අරණෙහි සංසුන් ඉරියව්වෙන් වැඩ සිටින අයුරු දැක තම උදයීභද්‍ර පුතා ද මෙලෙස සිටිනු දැකීම තම පැතුම බව රජතුමා සඳහන් කොට ඇත. මහා ප්‍රතාපවත් රජකු වූ අජාසත් නිරිඳු තම පුතා ගැන තිබුණු ආකල්පය එබඳු වූවකි. අනේපිඬු සිටුතුමා තම පුතා දහමට යොමු කිරීමට විශේෂ උපක්‍රම පවා යෙදූ අයුරු බෞද්ධ සාහිත්‍යයෙන් පෙනී යයි. අශෝක රජතුමා තම දුව හා පුතා සසුන්ගත කොට සම්බුද්ධ ශාසනයට අමිල මෙහෙයක් ඉටු කොට තිබේ. සාරි බැමිණියගේ (සැරියුත් හිමියන් ඇතුළු) දූදරුවන් හත් දෙනකු ම (සාරිපුත්ත, චුන්ද, උපසේන, රේවත, චාලා, උපචාලා, සිසූපචාලා) පැවිදි ව රහත් භාවයට පත් වීමෙන් ඇය මේ බුද්ධ ශාසනයෙහි සුවිශේෂී මවක් වූවා ය. භද්‍ර හිමියන්ගේ මව ඇයට සිටි එක ම පුතු සත් හැවිරිදි වියේ දී ම පැවිදි කොට නිවන් සුව සලසා ගැනීමට අවකාශ ලබා දුන්නාය.

දෙමාපියන් වශයෙන් නිතර තම දරුවන් පිළිබඳව අපේක්ෂා කරන්නේ තමන්ට වඩා ගුණනුවණින් තම දරුවන් ඉදිරියට යනු දැකීමයි. එනම් අතිජාත දරුවන් බවට පත්වීමයි. එසේ නොවුණ හොත් අඩු වශයෙන් තමාට සමාන හෝ ගුණනුවණින් තම දරුවන් යුක්ත වනු දැකීම මව්පියන්ගේ අපේක්ෂාවයි. එනම් අනුජාත දරුවන් තැනීමයි (*අතිජාතං අනුජාතං පුත්තමිච්ඡන්ති පණ්ඩිතා*). එහෙත් කිසි දිනක තමාට වඩා ගුණනුවණින් පිරිහුණු (අවජාත) දරුවන් වනු දැකීමට දෙමාපියෝ අපේක්ෂා නොකරති.

## සැබෑ අනතුර - ලාභසත්කාරයන්ට ගිජු වීම

මෙම සූත්‍රයෙන් බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් අපේක්ෂා කරන්නේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවලට යටවුණු අය බවට තම දරුවන් පත් නොවීමට වගබලා ගන්නා ලෙසයි. එනම් අපට ලැබෙන ගේදොර, ඉඩකඩම්, ධනය, යානවාහන, දූදරුවන්, ඥාතීන්, රැකීරක්ෂා, අධ්‍යාපනය, කීර්ති, ප්‍රශංසා, තම දක්ෂතා, රූප සම්පත්තිය මේ ආදියට යමකු දැඩිව ආශා කළ හොත් ගුණදහමින් ඉහළට යාමට ඇති අවස්ථාව මගහැරී යයි. එබැවින් මෙම ලාභ සත්කාර ආධ්‍යාත්මික දියුණුවට බාධා කරන දරුණු දේ වශයෙන් දක්වා තිබේ. බොහෝ දෙනාට ආධ්‍යාත්මික වශයෙන් ඉහළට යාමට ඇති ප්‍රධානතම බාධාව මේවාට ගිජු වීමයි. සමාජගත ජීවිතයේ දී බොහෝ විට මේවා ලැබුණු පසු සමාජයෙන් ඉහළ කීර්ති ප්‍රශංසා ලැබෙන විට බොහෝ දෙනාට ඊට මුළා වේ. ඉන්පසු ආධ්‍යාත්මික දියුණුව මගහැරී යයි. එබැවින් මෙම ලාභ සත්කාර මාළුවකුට ඇටවූ ඇමක් වශයෙන් සඳහන් ව තිබේ. නුවණැති ශ්‍රද්ධාවන්ත දෙමාපියන් වශයෙන් මෙම ලාමක වූ ලාභසත්කාරවලට තම පින්වත් දරුවන් හසුනොවීමට වග බලා ගත යුතු බව මෙම සූත්‍රයෙන් විශේෂයෙන් අවධාරණය කෙරේ.

තවද වැඩිහිටියන් දෙමාපියන් වශයෙන් දරුවන්ගෙන් මෙබඳු දෑ අපේක්ෂා කරනවා මෙන් ම වැඩිහිටියන් දෙමාපියන් වශයෙන් ඔබ ද ඔබගේ මව්පියන්ට ගෞරවයක් පිනක් ලැබෙන පරිදි ඉහත ආදර්ශ පිළිපැදිය යුතු ය. ඔබ අද දූදරුවන්, ධනය ආදිය ලබා ඇත්නම් ඊට දැඩිව ආශා නොකර ආධ්‍යාත්මික වශයෙන් උසස් තලයකට පත්වීමට ද අදිටන් කර ගත යුතු ව පවතී. එම දරුවන්ට ධර්මයේ ආශීර්වාදය, ආභාසය ලබා

දෙන ගමන් අප එම ධර්මයෙන් උසස් ම ප්‍රතිඵල ලබා ගැනීමට උත්සුක විය යුතුය. තමාට දරුවන් සිටිය ද එම දරුවන් හැම ද තමාට අයිති නොවන අතර යම් දිනෙක් ඔවුන් සියල්ල අතහැර තම කර්ම ශක්තිය පමණක් රැගෙන යාමට සිදුවන බැවින් තම ආධ්‍යාත්මික දියුණුව පිළිබඳව නිරතුරුව අවධානයෙන් කටයුතු කළ යුතුව ඇත. තමාට තම සිරුර ද අත්හැරීමට සිදුවන ලොවක දරුවන් ගැන කවර විශ්වාසයක් තැබිය හැකි ද? යනු බුදුසසුනේ අනුශාසනයයි (*අත්තා හි අත්තානො නත්ථි කුතො පුත්තෝ කුතො ධනං*).

ඇතැම් විට මව්පියන් ඉතා ම දැහැමි ජීවිත ගත කළ ද සසරගත කර්මවිපාක වශයෙන් දරුවන් අකීකරු වන අවස්ථා දක්නට ලැබේ. දරුවන්ගෙන් නොයෙක් හිංසාපීඩාවලට පත්වීමට ද මව්පියන් සිදුවන අවස්ථා තිබේ. මෙහි දී ධර්මය පිළිබඳ අවබෝධයක් ඇති මව්පියන් වශයෙන් අප බුද්ධිමත් ව ක්‍රියා කළ යුතු ය. ඒ පිළිබඳව කළකිරීමට පත් නොවී දුකට පත්නොවී වඩ වඩාත් දහමින් ඵල නෙළා ගැනීමට එය අවස්ථාවක් කර ගත යුතු ව ඇත. බිම්බිසාර රජතුමා තමාගේ පුතා ඉපදීමට කලින් ම තමාගේ ජීවිතයට හානියක් කරන බව දැනගෙන ම එම දරුවා හොඳින් කරුණාවෙන් පෝෂණය කළ අතර බුදුරදුන් වෙතින් ධර්ම ශ්‍රවණය කොට ඔහු දහමින් ඵල නෙළා ගත් බැවින් පුතාගෙන් එළඹුණ දුක්පීඩාවලදී කළකිරීමට පත් නොවී ධර්ම ප්‍රීතියෙන් ක්‍රියා කළ අයුරු බෞද්ධ සාහිත්‍යයෙන් ප්‍රකට වේ.

මෙම සූත්‍රයන්ගෙන් අපට ලබා ගත හැකි ප්‍රධාන අනුශාසනය නම් දරුවන් පිළිබඳ ඉහළ ම ආදර්ශය ලබා දී ඔවුන් සුමගට ගැනීමට උත්සාහ දරන අතර ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසාවලට ගිජු නොවීමට වගබලා ගැනීමයි. බොහෝ විට අපගේ ආධ්‍යාත්මික දියුණුව අඩාල වන ප්‍රධානතම කරුණ නම් ලාභ සත්කාරවලට ඇති දැඩි ආශාවයි. මෙය නොපෙනෙන වේශයෙන් පැමිණ අපව මුළාවට පත් කරයි. අපගේ ස්වර්ග මාර්ගය හා මෝක්ෂ මාර්ගයට හානි පමුණුවයි. අපේ සියලු ආධ්‍යාත්මික ජයග්‍රහණ රඳා පවත්නේ ලාභ සත්කාරවලට ගිජු නොවීම හා ඉන් මුළා නොවීම මතයි. ලාභ සත්කාර හමුවෙහි මුළා නොවීමට නම් මනා සිහිනුවණින් ධර්මය පිළිබඳ නිසි අවබෝධයකින් නිරතුරුව වීර්යයෙන් ක්‍රියා කළ යුතුව පවතී.

දරුවන් වෙතින් දෙමාපියන්ට වඩාත් උසස් ලෙස සැලකීමට නම් ඉතා උසස් අයුරින් දහමෙහි හැසිරීම අවශ්‍ය කෙරේ. බුදුරදුන් දේශනා කළ ධර්මය මැනැවින් ශ්‍රවණය කොට දාන, සීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්හි මෙන් ම සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවන්හි යෙදීමට අප සමත් වුවහොත් අප මෙලොවට ජනිත කළ මව්පියන්ට ඉහළම ගෞරවය මෙන් ම පින ද හිමි වනු ඇත. එවිට හුදෙක් මෙලොව මව්පියන් පමණක් නොව අතීතයෙහි අප පෝෂණය කළ අපේ දෙමාපියන්ට ද පින් අනුමෝදන් වීමට අවකාශ උදාවේ. පටිච්ච සමුප්පාදය පිළිබඳ මනා වැටහීමෙන් චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධයෙන් යුතුව ආනාපානසති භාවනාව ඔස්සේ සතර සතිපට්ඨානයෙහි යෙදෙමින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමට අප සමත් වුවහොත් එමගින් අපට දුකින් නිදහස්වීමට මෙන් ම අපේ දෙමාපියන්ට ආශීර්වාද හා පුණ්‍යානුමෝදනා කිරීමට ද අවස්ථාව උදාවේ. අපගේ ජීවිතයට හුස්ම පොද දයාද කළ අපේ දයාබර අම්මාට හා තාත්තාට ලබා දිය හැකි උතුම් ම දයාදය මෙන් ම කෘතඥතාව ද වන්නේ එම සුසුම් පොද ම උත්තරීතර නිවන සඳහා භාවිත කිරීමෙනි.

ඔබ සැමට තෙරුවන් සරණයි !

එක්සත් ජනපදයේ කොවීනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

**දසදින සූත්‍රධර්ම විවරණ වැඩසටහන 05 වන දේශනය**

(2020 දෙසැම්බර මස 11 වන සිකුරාදා) (UD)

# An Only Son – *Ekaputtaka Sutta*

At Sāvatthī. "Possessions, honor, and popularity are brutal …

A faithful laywoman with a dear and beloved only son would rightly appeal to him, 'My darling, please be like the householder Citta and Hatthaka of Aḷavī.'

These are a standard and a measure for my male lay disciples, that is, the householder Citta and Hatthaka of Aḷavī.

'But my darling, if you go forth from the lay life to homelessness, please be like Sāriputta and Moggallāna.'

These are a standard and a measure for my monk disciples, that is, Sāriputta and Moggallāna.

'And my darling, may you not come into possessions, honor, and popularity while you're still a trainee and haven't achieved your heart's desire.'

If a trainee who hasn't achieved their heart's desire comes into possessions, honor, and popularity it's an obstacle for them. So brutal are possessions, honor, and popularity. …"

# An Only Daughter – *Ekadhitu Sutta*

At Sāvatthī. "Possessions, honor, and popularity are brutal …

A faithful laywoman with a dear and beloved only daughter would rightly appeal to her, 'My darling, please be like the laywomen Khujjuttarā and Veḷukaṇṭakī, Nanda's mother.'

These are a standard and a measure for my female lay disciples, that is, the laywomen Khujjuttarā and Veḷukaṇṭakī, Nanda's mother.

'But my darling, if you go forth from the lay life to homelessness, please be like the nuns Khemā and Uppalavaṇṇā.'

These are a standard and a measure for my nun disciples, that is, the nuns Khemā and Uppalavaṇṇā.

'And my darling, may you not come into possessions, honor, and popularity while you're still a trainee and haven't achieved your heart's desire.' If a trainee who hasn't achieved their heart's desire comes into possessions, honor, and popularity it's an obstacle for them.

So brutal are possessions, honor, and popularity. …"

(Translated by Bhikkhu Sujato)

# Abraham Lincoln's Letter to His Son's Teacher
## ඒබ්‍රහම් ලින්කන් තම පුතාගේ ගුරුතුමාට ලියූ ලෝක ප්‍රකට ලිපිය

He will have to learn, I know,
that all men are not just,
all men are not true.
But teach him also that
for every scoundrel there is a hero;
that for every selfish Politician,
there is a dedicated leader...
Teach him for every enemy there is a friend,
(සියලු මිනිසුන් දැහැමි නොවන බවත්
සත්‍යවාදී නොව බවත් මගේ පුතාට ඉගෙන ගත යුතුව පවතී.
සෑම අදැහැමි දුර්ජනයකු පාසා ම වීරයකු ද සිටින බවත්
සෑම ආත්මාර්ථකාමී දේශපාලනඥයකු පාසා ම ඇපකැප වූ අවංක නායකයකු සිටින බවත්
සෑම දුර්ජන සතුරකු පාසා ම අවංක මිතුරකු සිටින බවත් මපුතනුවන්ට උගන්වන්න.)

Steer him away from envy,
if you can,
teach him the secret of
quiet laughter.
(ගුරුතුමනි, ඔබට හැකි නම්, ඊර්ෂ්‍යාවෙන් /දුර්ගුණවලින් බැහැරට ඔහුව මුදවන්න.
අව්‍යාජ, සන්සුන් සිනහවෙහි රහස ඔහුට උගන්වන්න.)

Let him learn early that
the bullies are the easiest to lick... Teach him, if you can,
the wonder of books...
But also give him quiet time
to ponder the eternal mystery of birds in the sky,
bees in the sun,
and the flowers on a green hillside.
(ඔබට හැකිනම්, දමරිකයන් පරාජය කිරීමට පහසු බව ඔහුට කලින් ම උගන්වන්න.
පොතපතෙහි අසිරිය ඔහුට කියාදෙන්න.
අහස්කුස පියාසර කරන කුරුල්ලන්, හිරු රැසින් බබලන මීමැස්සන්,
හරිත කඳුකරයේ ඇති මල්වල චමත්කාරය ආදිය නරඹමින්
ඒ තුළ සැඟවුණු සදාකාලික රහස ඔහුට උගන්වන්න.)

In the school teach him
it is far honorable to fail
than to cheat...
Teach him to have faith
in his own ideas,
even if everyone tells him
they are wrong...
Teach him to be gentle
with gentle people,
and tough with the tough.
(පාසලේ දී විභාගවලින් අසමත්වීම, වංචාවෙන් සමත්වීමට වඩා
බෙහෙවින් ගෞරවාන්විත බව ඔහුට උගන්වන්න.
අන් අය විරුද්ධ වුව ද තම නිවැරදි මතය පිළිබඳ විශ්වාසය තබන්නට ඔහුට කියා දෙන්න. මෘදු අය සමග
මෘදු ලෙසත් සැරපරුෂ අය සමඟ අනුරූප ලෙසත් ක්‍රියා කළ අයුරු ඔහුට උගන්වන්න.)

Try to give my son
the strength not to follow the crowd
when everyone is getting on the band wagon...
Teach him to listen to all men...
but teach him also to filter
all he hears on a screen of truth,
and take only the good
that comes through.
(හැම දෙනා ම අනුගමනය කරන ජනප්‍රිය රැල්ල ම අනුගමනය කිරීම
අනවශ්‍ය බව පිළිබඳ ශක්තිය මපුතණුවන්ට ලබා දෙන්න.
හැමදෙනාට ම සාවදානව ඇහුම්කන් දෙන්නටත්
එහෙත් යහපත් දේ පමණක් කිරා මැන බලා
පෙරා ගන්නටත් මපුතනුවන්ට උගන්වන්න.)

Teach him if you can,
how to laugh when he is sad...
Teach him there is no shame in tears,
Teach him to scoff at cynics
and to beware of too much sweetness...
Teach him to sell his brawn
and brain to the highest bidders
but never to put a price-tag
on his heart and soul.
(ගුරුතුමනි, ඔබට පුළුවන්නම්, දුකේ දී පවා සිනාසෙන අයුරු ඔහුට උගන්වන්න.
කඳුළු බිඳුව ලැජ්ජාවට කරුණක් නොවන බව ද ඔහුට කියා දෙන්න.
හැමදෙනා ම විවේචනය කරන්නවුන් දෝෂ දර්ශනයට ලක්කරන්නට මපුතනුවන්ට කියා දෙන්න.
අතිශයෝක්තියෙන් චාටුබස්වලින් ප්‍රවේශම් වන්නට ඔහුට උගන්වන්න.
ඔහුගේ ශරීර ශක්තිය හා දැනුම ඉහළ ම මිලට විකුණන්නටත්
එහෙත් තම හෘදය ශාක්ෂියට සහ ආත්ම ගරුත්වයට
මිලක් නියම නොකරන්නටත් ඔහුට කියා දෙන්න.)

Teach him to close his ears
to a howling mob
and to stand and fight
if he thinks he's right.
Treat him gently,
but do not cuddle him,
because only the test
of fire makes fine steel.
(බෙරිහන් දෙන සටන්පාඨවලට සවන් නොදීමටත්
තමන් නිවැරදි මතය වෙනුවෙන් නැඟී සිටීමටත් ඔහුට උගන්වන්න.
ඔහුට මෘදු ලෙස සලකන්න. නමුත් අනවශ්‍ය හුරුතලයෙන් වළකින්න.
නියම යකඩ රත් වන්නේ රත්වූ උදුනකින් බැවිනි.)

Let him have the courage
to be impatient...
let him have the patience to be brave.
Teach him always
to have sublime faith in himself,
because then he will have
sublime faith in mankind.
(ධෛර්ය අවශ්‍ය තැන නොඉවසිලිවන්තව ක්‍රියා කරන්නටත්
නිර්භීතභාවයේ (ජයග්‍රහණයේ) දී ඉවසීමත් ඔහුට ලබා දෙන්න.
තමා පිළිබඳ හැමවිට උපරිම ම විශ්වාසය තබන්නට ඔහුට උගන්වන්න.
එවිට ඔහු මානව වර්ගයා පිළිබඳ ඉහළ ම විශ්වාසයක් තබන බැවිනි.)

This is a big order,
but see what you can do...
He is such a fine fellow,
my son!
(මෙය බැරෑරුම් විධානයකි. නමුත් ඔබට හැකි පමණින් එය සපුරන්න.
මගේ පුතා යහපත් දරුවෙකි.

(UD)